[ සියලුම හිමිකම් ඇවිරිණි ]
[ முழுப் பதிப்புரிமையுடையது ]
[All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | චිත්‍ර - I පත්‍රය<br>சித்திரம் வினாத்தாள் - I<br>Art Paper - I | පැය එකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

❖ පහත දැක්වෙන රූප සටහන ඇසුරු කරගෙන අංක 01-05 දක්වා දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන බුද්ධ ප්‍රතිමාව පොළොන්නරු යුගයට අයත් .............................. හි දක්නට ලැබෙන නිර්මාණයකි. 02. උස අඩි 22 ක් පමණ වන මෙම ප්‍රතිමාව .............................. ඉරියව්වෙන් යුක්තව නෙලා ඇත. 03. චීවරයේ .............................. රැළි යෙදීම මෙම යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන ලක්ෂණයකි.

04. බුදු පිළිමයේ දෑතින් නිරූපණය වන .............................. මුද්‍රාව ලක්දිව බුදු පිළිම අතර හමුවන දුලභ මුද්‍රාවකි.

05. ප්‍රතිමාව නිර්මාණය කර ඇත්තේ .............................. මාධ්‍යයෙනි.

❖ අංක 06-10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර සපයන්න.

06. ලාක්ෂා කර්මාන්තයේ දී භාවිත කෙරෙන ලාක්ෂා වර්ග දෙකෙන් එක් වර්ගයක් කෝන් ලාකඩය. අනෙක් වර්ගය හඳුන්වන්න. ..............................

07. ටවර්හෝල් නාට්‍ය සඳහා චිත්‍ර වස්ත්‍ර සකස් කළ ඊවඩ් හෙන්රිකස්ගේ බටහිර චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ ඇසුරින් බෞද්ධ සිතුවම් කලාවක් ලාංකීය බොදු ජනයා අතර ජනප්‍රිය කළ චිත්‍ර ශිල්පියා නම් කරන්න. ..............................

08. සොබාදහමේ නෙළුම් මල් හා කොළ වල රිද්මයානුකූල බව ආදර්ශයට ගනිමින්, ඉදිකළ සුවිශේෂී කුළුණු හැඩ සහිත පොළොන්නරු යුගයට අයත් අලංකාර ගෘහ නිර්මාණය කුමක් ද ? ..............................

09. පැරණි වාස්තු ශිල්පියාගේ, ශිල්පීය දක්ෂතාව විදහා දක්වමින්, එක් දැව ඇණයකින් පරාළ විසිහයක් රඳවා ඇති ඇම්බැක්ක දේවාලයේ වහළ නිර්මාණ ක්‍රමය හඳුන්වන නම කුමක්ද? ..............................


10. ගෙඩිගේ නම් වූ වෘත්තාකාර පියස්සකින් සමන්විත වූ, ගම්පල යුගයට අයත් ගඩලාදෙණි විහාරයේ දක්නට ලැබෙන ගෘහනිර්මාණ ලක්ෂණ කුමන සම්ප්‍රදායට අයත් වේද? ..............................

❖ ප්‍රශ්න අංක 11-15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. 19 වන සියවසේ, යුරෝපීය මූර්ති කලාව නව මගකට යොමු කළ හෙන්රි මුවර් ශිල්පියා
   i. වියුක්ත රූපී හැඩතල ඇසුරින් විශාල ප්‍රමාණයේ උද්‍යාන මූර්ති රැසක් නිර්මාණය කරන ලදී.
   ii. ස්වාභාවික හැඩතල භාවිත කරමින් විශාල උද්‍යාන මූර්ති නිර්මාණය කරන ලදී.
   iii. මූර්ති නිර්මාණයේදී අප්‍රිකානු වෙස්මුහුණු කලාවේ ආභාෂය ලබා ගන්නා ලදී.
   iv. ග්‍රීක රෝම කලාවේ හා පුනරුද යුගයේ පැවති සාම්ප්‍රදායික මූර්ති නිර්මාණය කරන ලදී.

12. නවනාරී කුඤ්ජරය නැමැති සම්ප්‍රදායික සැරසිලි මෝස්තරය,
   i. කාන්තා රූප ඇසුරින් කළයක ආකාරයට නිර්මාණාත්මකව ඉදිරිපත් කර ඇත.
   ii. කාන්තා රූප හා හංස මෝස්තර ඒකාබද්ධ කර නිර්මාණය කර ඇත.
   iii. කාන්තා රූප ඇසුරින් හස්තියකුගේ ගමන් විලාශය අතිශය නිර්මාණාත්මකව ඉදිරිපත් කර ඇත.
   iv. කාන්තා රූප ඇසුරින් අශ්වයකුගේ ස්වරූපය දක්වා ඇත.

13. පහත දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර වස්තූන් අතරින්, ක්ෂය වෘද්ධි ලක්ෂණය හොඳින් දර්ශනය වන රූප සටහන වනුයේ,



A B C D

   i. A රූපය යි.
   ii. B රූපය යි.
   iii. C රූපය යි.
   iv. D රූපය යි.


14. පෝස්ටර් චිත්‍රයක දක්නට ලැබෙන වඩාත් වැදගත් ලක්ෂණය වනුයේ,
   i. සංගත වර්ණ රාශියක් භාවිතා කර පණිවිඩයක් ලබා දීමය.
   ii. සරල සංඛේත භාවිත කරමින් නිරවුල් පණිවිඩයක් වේගවත්ව ප්‍රකාශ කිරීමයි.
   iii. අර්ථවත් දිගු වැකි යොදා පණිවිඩය ඉදිරිපත් කිරීමයි.
   iv. සංකීර්ණ හැඩතල භාවිතාකර පණිවිඩය ඉදිරිපත් කිරීමයි.

15. ඩේවිඩ් පේන්ටර් නම් ලාංකික චිත්‍ර ශිල්පියා විසින් අඳින ලද 'යහපත් සමරිතානුවරයා' නම් සිතුවමෙන්,
   i. යුරෝපීය පරිසරයේ දක්නට ලැබෙන ඇඳුම් පැළඳුම් හා පරිසර ස්වරූපය මැනවින් නිරූපණය කර ඇත.
   ii. ශ්‍රී ලාංකීය භූගෝලීය පසුබිම, සංස්කෘතිය හා මානව රූප පිළිබිඹු කෙරේ.
   iii. යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලා ලක්ෂණ හා යුරෝපීය සංස්කෘතිය දක්නට ලැබේ.
   iv. වියුක්ත හැඩතල සහිත ශ්‍රී ලංකීය මිනිස්රූප, පරිසරය හා සංස්කෘතිය නිරූපණය වේ.

❖ ප්‍රශ්න අංක 16-20 තෙක් දී ඇති රූප සටහන් වලට වඩාත් සෘජු සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A,B,C,D,E අතරින් තෝරා අදාල අක්ෂරය හිස්තැනෙහි ලියන්න.


16.  : ...............*

 A

17.  : ...............*

 B

18.  : ..................*  C

19.  : ..................*  D

20.  : ..................*  E

❖ අංක 21 - 25 දක්වා දී ඇති වාක්‍ය වල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

21. තෙ මාසයේදී හීරු දෙවියන් මුල්කරගෙන පවත්වන ආගමික උත්සවය .............................. ආගමිකයන් විසින් අතිශයෙන් උත්සවාකාරයෙන් පවත්වනු ලැබේ.

22. මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති රාශියකින් සමන්විත මහා කලාගාරයක් ලෙස සැලකෙන දඹුල්ල විහාරය ............................ රජු විසින් ඉදිකර ඇති බව සැලකේ.

23. අතීතයේ පයින් ගමන්ගත් ජනතාව තම විඩාව සංසිදුවා ගැනීමට නවාතැන් ගැනීම සඳහා ඉදි කළ ........................ දැනට ශේෂව පවත්නා දුර්ලභ දැව කැටයම් සහිත වාස්තු නිර්මාණයකි.

24. ඉතාලියේ ශාන්ත මරියා ඩෙලාග්‍රෙසි තාපසාරාමයේ භෝජනාගාර බිත්තියක ඇඳ ඇති ලියනාඩෝ ඩාවින්චිගේ අවසන් භෝජන සංග්‍රහය චිත්‍රය ............................ ශිල්ප ක්‍රමය අනුව නිර්මාණය කරන ලද්දකි.

25. ඉන්දීය ............................ කලා සම්ප්‍රදායට අයත් අනගිභවනීය බුද්ධ ප්‍රතිමාවක් ලෙස සැලකෙන සාරානාත් බුදු පිළිමය, විශිෂ්ඨ භාව ප්‍රකාශයකින් සමන්විත වේ.

❖ 26 -30 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන පරිදි වාක්‍යයක් ලියන්න.

26. කියරොස්කුරෝ - ..................................................................................


27. වයනය - ..................................................................................


28. ටැම්පිට විහාරය - ..................................................................................

29. අරිම්බුව - ..................................................................................

30. කැලියෝග්‍රැෆි - ..................................................................................

❖ අංක 31-35 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා F,G,H,I,J යන රූප ඇසුරින් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන ඉසුරුමුණි විහාරයට අයත් කැටයම් වල දක්නට ලැබෙන කලා සම්ප්‍රදාය කුමක් ද ?

.............................................

32. G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය හඳුන්වන නම කුමක්ද ? .........................................

33. H අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල, නිර්මාණ කර ඇති ශිල්පියා නම් කරන්න. .........................................

34. I අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කර ඇති මාධ්‍යය කුමක් ද? .........................................

35. J අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කළ ශිල්පියා නම් කරන්න. .........................................

❖ 36-40 දක්වා චිත්‍රය හඳුනාගෙන,දී ඇති තේමා යටතේ වාක්‍ය 05 කින් කලාත්මක ඇගයීමක් කරන්න.



36. දක්නට ලැබෙන ස්ථානය - .........................................

37. තේමාව - .........................................

38. ශිල්පක්‍රමය - .........................................

39. වර්ණ භාවිතය - .........................................

40. ශිල්පීය කුසලතා - .........................................

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | චිත්‍ර -III පත්‍රය<br>சித்திரம் வினாத்தாள்- III<br>Art Paper - III | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>**Two Hours** |
|---|---|---|

**සැලකිය යුතුයි,**
- ❖ ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි
- ❖ ඔබේ විභාග අංකය / නම , පාසල හා අදාල ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- ❖ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට දෙන විට වියළි තිබිය යුතුය.
- ❖ දිය සායම්,පෝස්ටර් සායම්, පැස්ටල් ආදී අතේ නොගෑවෙන ඕනෑම මාධ්‍යයක් වර්ණ සහිත භාවිත කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)

- "අ" හෝ "ආ" යන කොටසින් හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

### "අ" කොටස - චිත්‍ර සංරචනය

1. සිරිපා වන්දනාවේ යන බැතිමතුන්
2. වනෝද්‍යානයක් තුළ අනතුරක ඉව වැටුනු මුව රංචුවක්
3. දොළක දිය නාන ගමේ කොලු ගැටවු
4. පහත සඳහන් කවිය අර්ථවත් කරමින් වර්ණවත් චිත්‍රයක් අඳින්න.

   දාඩිය මුතුවැල් ගතේ දිලෙන්නේ
   සතුටු සිනාමල් වතේ පිපෙන්නේ
   රටේ දියුණුවයි හිතේ තියෙන්නේ
   කවි කියමින් ළිය කෙතේ නෙළන්නේ

### "ආ" කොටස - ග්‍රැෆික් නිර්මාණ

5. "මත් උවදුර දුරු කරමු " තේමාව යටතේ වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
6. "ළදරු ඇඳුම් මෝස්තර " යන මැයෙන් පොත් පිටකවරයක් සැලසුම් කරන්න.
7. පාසලේ චිත්‍ර කලා සංගමය මගින් පවත්වනු ලබන චිත්‍ර ප්‍රදර්ශනය සඳහා ආරාධනා පත්‍රයක් සැලසුම් කරන්න.
8. නවතම ගුවන් විදුලි සේවාවක් සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

### "ඉ" කොටස - මෝස්තර නිර්මාණය

9. ස්වාභාවික මල් හා කොළ ඇසුරු කරගෙන චීත්ත රෙද්දක් සඳහා භාවිත මෝස්තරයක් නිර්මාණය කරන්න.
10. බතික් සම්ප්‍රදායට අනුකූලව නිම කෙරෙන ඔසරි පල්ලුවකට සුදුසු සැරසිල්ලක් පාරම්පරික සැරසිලි ඒකක ඇසුරින් සැලසුම් කර වර්ණ ගන්වන්න.
11. නිවසේ පිරිත් මණ්ඩපයකට පිවිසෙන දොරටුව අලංකාර කිරීම සඳහා සුදුසු අලංකාර සැරසිල්ලක් සැලසුම් කරන්න. (භාවිත අමු ද්‍රව්‍ය ගැළපෙන අයුරින් වර්ණ ගන්වන්න.)
12. චතුරස්‍රාකාර කුෂන් කවරයක් සඳහා වියුක්ත ~~ජ්‍යාමිතික~~ හැඩතල භාවිතයෙන් මුළු තල මෝස්තරයක් නිර්මාණය කරන්න.

( ලකුණු 30)

Ag - 1

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | චිත්‍ර -II පත්‍රය<br>சித்திரம் வினாத்தாள்- II<br>Art Paper - II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

සැලකිය යුතුයි,

- ❖ ඔබේ විභාග අංකය / නම , පාසල හා අදාල ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- ❖ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට දෙන විට වියළි තිබිය යුතුය.
- ❖ දිය සායම්,පෝසටර් සායම්, පැස්ටල් ආදී අතේ නොගෑවෙන ඕනෑම මාධ්‍යයක් වර්ණ සහිත භාවිත කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)

<u>නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ සම්පිණ්ඩනය</u>

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රළු කඩදාසියක් මත රේඛා මගින් පූර්ව අධ්‍යයනය යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් වර්ණ කිරීමට සුදුසු චිත්‍ර කඩදාසියක ඇඳ වර්ණ ගන්වන්න.

- මෙම චිත්‍ර දෙකම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේදී පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වේ.

1. රේඛා අධ්‍යයනයේදී දක්වන කුසලතා
2. වර්ණ චිත්‍රය

- ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම.
- පරිමාණය, පර්යාවලෝක රීති ,ත්‍රිමාණ ලක්ෂණ දැක්වීම.
- දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
- උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව.

<u>සැලකිය යුතුයි.</u>

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස්කර ඇඳීමට ඔබට අවසර ඇත.

( ලකුණු 30)